255

දුර්ලභ

# ලාංකීය සිනමාව
# සහ
# ධර්මසේන පතිරාජගේ සිනමා අනන්‍යතාව

කේ.ජී.එස්. බණ්ඩාර

MACO / R / 48 / 98


| ප්‍රවිෂ්ට අංකය | 255 |
| --- | --- |
| වර්ගී අංකය | |


කැලණිය විශ්ව විද්‍යාලයේ ජනසන්නිවේදන විධි සාමාජ්‍ය විද්‍යාපති පර්යේෂණ මගින් උපාධිය සඳහා මෙම ස්වාධීන පර්යේෂණ නිබන්ධය ඉදිරිපත් කරන ලදී.

1998

# සාරාංශය

ලෝකයේ සිනමාව නම් කලා මාධ්‍යයට ඇත්තේ වසර සියයක තරම් කෙටි ඉතිහාසයකි. එය ලෝකයේ අනෙකුත් කලා මාධ්‍යයන්ට සාපේක්ෂව විමසීමේදී ඉතා කෙටි ඉතිහාසයකි. එනමුත් සිනමාව අනෙකුත් කලා මාධ්‍යයන් අතුරින් ( නාට්‍ය, කවිය, නවකතාව, කෙටි කතාව) සුවිශේෂ පසුබිමක් ගොඩ නගා ගෙන තිබේ. විසිවන සියවසේ කලාව ලෙස ද නම් කෙරුණු සිනමාව අසීමිත ප්‍රකාශන ශක්තියකින් යුක්තය. වරෙක චිත්‍රපටය පිළිබඳ සර්ජ් අයිසන්ස්ටයින් කීවේ,  සිනමාව වූ කලී අපගේ ආධ්‍යාත්මික ක්‍රියාකාරීත්වයේ ආවේණික කලා ස්වරූපයක් නිරූපනය කිරීමට ඉවහල් වන නොසිඳෙන කලා උල්පතක් යනුවෙනි. අනෙක් පසෙන් සිනමාව ආධ්‍යාත්මික ක්‍රියාකාරීත්වයේ පිළිඹිබුවක් සේම සෞන්දර්යාත්මක ශක්‍යතාවන්ගෙන් පිරුණ බහුජන ආකර්ශනයට බෙහෙවින් හසු වූ මාධ්‍යයක් ලෙසින් වටහා ගැනීමේ සාවද්‍යතාවක් ද නොමැත. කෙසේ වතුදු ලෝක සිනමාවට සාපේක්ෂව ලාංකීය සිනමාවේ ගමන් මග ඉතාම කෙටි වුවද ලාංකීය සිනමාවේ සුවිශේෂ සන්ධිස්ථාන සනිටුහන් කල සිනමා නිර්මාණ හා සිනමාකරුවන් කිහිප දෙනෙකුම ලාංකීය සිනමාව සතුය. ලෙස්ටර් ජේම්ස් පීරිස්, ධර්මසේන පතිරාජ, වසන්ත ඔබේසේකර, තිස්ස අබේසේකර, ධර්මසිරි බණ්ඩාරනායක ඒ අතර සුවිශේෂ සිනමා අධ්‍යක්ෂවරු ය. මේ හැම අධ්‍යක්ෂවරයෙකුම තම තමන්ටම අනන්‍ය වූත්, යථාර්ථවාදී වූත් නව සිනමා සංස්කෘතියක් ගොඩ නැගීම සඳහා අරගලයක නිරත වූවෝය. එහිදී ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ  “නිධානය”, ධර්මසේන පතිරාජගේ “අහස්ගව්ව”, “සොල්දාදූඋන්නැහේ”, වසන්ත ඔබේසේකරගේ “දඩයම” ආදී සිනමා නිර්මාණ ලාංකීය සිනමා වංශයේ ගුණාත්මක හර පෝෂණය කළ ප්‍රේක්ෂක විඥානය  හොඳින් ග්‍රහණය කොට ගත් ඉස්මතුව පෙනෙන නිර්මාණයෝ වෙති.

හින්දි සිනමාවේ ආකෘති ගෙඩි පිටින් ලාංකීය සිනමා කර්මාන්තය ආක්‍රමණය කොට එය වෙලා ගෙන තිබූ අවධියක ලෙස්ටර් ජේම්ස් පීරිස් දේශීය සිනමා අනන්‍යතාවක ලාංඡනය ස්පර්ශ කිරීමට ප්‍රයත්න දැරීය. කැමරා කෝණය චිත්‍රාගාරයෙන්  එළියට ගත් ලෙස්ටර් ස්වභාවික පරිසරයේ සිතුවම් විචිත්‍රවත් ලෙස සිනමාවට නැගීමේ ප්‍රතිඵලයක් ලෙස “රේඛාව” නම් චිත්‍රපටය ඔහු අතින් නිමවුණු අතර දැනුදු ඇතැම් විචාරකයින් ලාංකීය සිනමාවේ ආරම්භක සිනමා පටය ලෙස එය හැඳින්වීමට පසුබට නොවේ. රේඛාවෙන් ප්‍රකට කළ දේශීය සිනමාවක ගති ලක්ෂණ හා නව ආරක සිනමා රීතිය යළිත් ප්‍රතිෂ්ඨාපනය කිරීමට ලෙස්ටර්ගේම “ගම්පෙරළිය”

චිත්‍රපටය සමත් විය. ඒ අයුරින් දේශීය සිනමාවේ ඉස්මතුව පෙනෙන ලෙස්ටර් සුවිශේෂ ස්ථානයක් හිමිකර ගත් අතර ඉන් අනතුරුව එකී තත්ත්වය හෝ ඉන් ඔබ්බට ගිය සුවිශේෂතාවක් ධර්මසේන පතිරාජ නම් සිනමා කරුවාගේ සිනමා නිර්මාණ තුළ ප්‍රකට කළේය.

තරුණ අසහනය, විරැකියාව, පීඩිත පන්තියේ ජනතාවගේ දිවි පැවැත්ම, කුල භේදය ආදී විවිධ තේමාවන් ඔස්සේ තම පරිකල්පනය මෙහෙය වූ පතිරාජ යථාර්ථවාදී සිනමාවේ පෙර ගමන්කරුවෙකු බවට තම අනන්‍යතාව ප්‍රකට කළේය. අනෙක් පසින් ඔහු විවිධ සමාජ සංස්ථාවන්ගේ සහසම්බන්ධතාවන් ගැඹුරු දෘෂ්ටියක් තුළ විවරණය කිරීමට උත්සාහ ගත් සිනමා කරුවෙකි. විශ්ව විද්‍යාල සිසුවෙකු ලෙස සිටිමින්ම 1969 දී "හන්තානේකතාව" හි චිත්‍රපටයෙහි තිර රචනය කරමින් තම ප්‍රතිභාව ප්‍රකට කළ පතිරාජ 1974 දී තම මුල්ම සිනමා නිර්මාණය වූ "අහස්ගව්ව" වෘත්තාන්ත චිත්‍රපටය ඉදිරිපත් කළේය. නාට්‍යකරණයට ප්‍රවේශ වූ පතිරාජ "කොරා සහ අන්ධයා", "පුටු" ආදී නාට්‍ය නිර්මාණ කළේය. සතුරෝ ඔහුගේ මුල්ම කෙටි චිත්‍රපටයයි. සිංහල සිනමාවේ නව මං හෙළි කළ 1974 එළි දුටු "අහස්ගව්ව" පතිරාජ ගේ ප්‍රථම වෘත්තාන්ත සිනමා නිර්මාණය වූ අතර, එම වසරේ හොඳම චිත්‍රපටයට හිමි විචාරක සම්මානය "අහස්ගව්ව" සතු විය. "බඹරුඇවිත්" චිත්‍රපටය සඳහා එකී වසරේ හොඳම චිත්‍රපටය ලෙස ජනාධිපති සම්මානය ලැබීය. ඉන්දියානු සිනමා කරුවන්ගේ දෘෂ්ටියට පවා හසු නොවුණු විෂය ක්ෂේත්‍රයක් , එනම් කුල භේදය පාදක කොටගත් "පොන්මණී" පතිරාජ නිර්මාණය කළ ද්‍රවිඩ චිත්‍රපටයයි.ප්‍රේක්ෂක හා විචාරක ඇඩි විමසුමට ලක් වූ පාරදිගේ ඔහුගේ පස්වන සිනමා වෘත්තාන්තය විය. පතිරාජගේ සිනමා දිවියේ සුවිශේෂ සන්ධිස්ථානයක් වූ "සොල්දාදුඋන්නැහේ" සඳහා එම වසරේ ජනාධිපති සම්මානය හිමි විය. "වාසුලි" සහ "සිරකඳවුර" නමින් තවත් වෘත්තාන්ත සිනමා පට දෙකක් පතිරාජ අතින් නිර්මාණය වුවද සමකාලීන සමාජ සාධක හේතු කොට ගෙන ඒවා වාරණයට හා තහනමට ලක්විය. කෙසේ වතුදු පතිරාජගේ සිනමා නිර්මාණ ලාංකීය සිනමාවේ විශිෂ්ට සළකුණක් තැබුවා යැයි කීම අතිශයෝක්තියක් නොවේ.ඔහුගේ සිනමා නිර්මාණ තුළ ඉස්මතුව පෙනෙන විශිෂ්ට බවම පමණක් නොව විවිධ තේමාවන් සොයා ගිය පුද්ගල ජීවිතයේ ඇතුළාන්තය ගැඹුරින් විශ්ලේෂණය කොට තමා අවට භෞතික සාධක හා පුද්ගල බද්ධ සිද්ධි ගළපා අපූරුවත්වයක් ගොඩ නැගු සිනමාකරුවෙකු ලෙස ද ඔහු අපගේ පර්යේෂණ නිබන්ධය සඳහා තෝරා ගැනුණි.

ධර්මසේන පතිරාජගේ  සිනමා නිර්මාණයන්හි අන්තර්ගතය හෝ ඔහුගේ සිනමා දෘෂ්ටිය ගවේශනය කරනු ලබන බොහෝ විචාරකයින්, සිද්ධාන්තවේදීන් විවිධ මතවාද ඉදිරිපත් කරති.අහස්ගව්ව "පාරදිගේ", "පොන්මණි" වැනි චිත්‍රපට සඳහා අර්ථකථන සපයන බොහෝ දෙනෙකු ඒවා යථාර්ථවාදී සිනමා කලාවකට උරුම ඒවා ලෙසත්, "බඹරුඇවිත්", "සොල්දාදුඋන්නැහේ" වැනි චිත්‍රපට දේශපාලන සිනමාවක ගතිලක්ෂණවලින් යුක්ත ඒවා බවත් පවසති. මෙම මතවාද දෙකට එරෙහි තවත් මතවාදයක් නම් පතිරාජගේ සිනමාවේ ඇත්තේ ස්වභාවිකවාදී සිනමාවේදයක් බවයි. මෙම විවිධ මතවාද අතරේ පතිරාජ දේශපාලන සිනමාකරුවෙකි යන මතවාදය වඩාත් ඉහළට ඉස්මතුව පැමිණියේ වුවද එය පැහැදිලි නිර්ණායකයක් ලෙස ගිනිය නොහැකි විය. එවැනි පසුබිමක ලාංකීය සිනමාවේ පතිරාජ සිනමා අස්ථානය කුමක්ද?යන්න සොයා බැලීමේ අරමුණු ඇතිව මෙම නිබන්ධය සකස් කිරීමට සැලසුම් කළේය.

ලාංකීය සිනමාව තුළ පතිරාජගේ සිනමා අස්ථානය ගවේෂණය කිරීමේ පර්යේෂණ ක්‍රමවේදය ලෙස මූලිකවම අන්තර්ගත විශ්ලේෂණාත්මක ක්‍රමයත් දෙවනුව සම්මුඛ සාකච්ඡා ක්‍රමයත් භාවිතයට ගැනීමට සිදු විය. අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමය යටතේ විධිමත්ව තෝරා ගත් චිත්‍රපට හතරක් අධ්‍යයනය කිරීමත් එනම් පතිරාජගේ චිත්‍රපට සියල්ල වීඩියෝ පට ආධාරයෙන් නරඹා වඩාත් උචිත ඒවා තෝරා ගැනීමක් කළේය. එම චිත්‍රපටවලට අදාලව ලියැවුණු පොතපත, සඟරා ආදී මූලාශ්‍ර අධ්‍යයනයත් පුස්තකාල පරිහරණයත් සිදු කළ අතර සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේ නිබන්ධනයේ කථානායක ධර්මසේන පතිරාජ සමගත්  ක්ෂේත්‍රයට අදාල ප්‍රවීනයන් හා විචාරකයින් සමගත් සම්මුඛ සාකච්ඡා පැවැත්වීය.

ලාංකීය සිනමාවේ පතිරාජගේ සිනමා අස්ථානය ගවේෂණය කරනු ලබන මෙම පර්යේෂණ නිබන්ධය පරිච්ඡේද කිහිපයකට බෙදා වෙන් කර කරුණු සාකච්ඡා කළේය. පළමුවන පරිච්ඡේදයෙන් සිනමාව පිළිබඳ නිර්වචන සහ දේශීය සිනමාවේ ගමන් මඟ එහි ස්වභාවය පිළිබඳ කරුණු විමර්ශනය කරන ලදී. දේශීය සිනමාවේ ගමන් මඟ පිළිබඳ පැහැදිලි අවබෝධයක් හා දෘෂ්ටියක් නොමැතිව ලාංකීය සිනමාවේ පතිරාජට හිමි තැන වටහා ගත නොහැකිය.මෙරට සිනමාවේ කෙටි ඇති අරගලයේ හරයත් ලබා ඇති ජයග්‍රහණත් දළ වශයෙන් අවධි තුනකට බෙදා ඇතැම් විචාරකයින් විග්‍රහ කරනු ලබයි. කඩවුණු පොරොන්දුවේ සිට රේඛාව දක්වා අවධිය, රේඛාව සිට ගම්පෙරළිය දක්වා අවධියත් හා ගම්පෙරළියෙන් පසු අවධියත් ලෙස ගෙන විග්‍රහ කළහොත් පතිරාජගේ සිනමා කාර්යය ගම්පෙරළියෙන් පසු අවධියට අයත් ය.

පුස්තකාලය
කැලණිය විශ්වවිද්‍යාලය (ශ්‍රී ලංකාව)
කැලණිය.

නිබන්ධයේ දෙවන පරිච්ඡේදයෙන් ධර්මසේන පතිරාජගේ සිනමා නිර්මාණ බිහි වූ වකවානුවේ සමකාලීන සමාජයේ සමාජ ආර්ථික සහ දේශපාලනික හැසිරීම පිළිබඳ අධ්‍යයනයටත් තෝරා ගත් සමකාලීන සිනමාකරුවන් කිහිපදෙනෙකුගේ සිනමා නිර්මාණ පිළිබඳ ඇගැයීමටත් වෙන් කෙරිණි. පතිරාජ නම් සිනමාකරුවා හුදෙකලා පුද්ගල ඒකකයක් නොවේ. ඔහු මහා සමාජයේම කුඩා ප්‍රපංචයකි. මෙනයින් පතිරාජ ඉපැදි හැදී වැඩුණු වකවානුවත්, (1950. 60. 70) ඔහු වඩාත් තම ජීවිතයේ අත්විඳි සමාජ වටපිටාවත් පිළිබඳව කරුණු අධ්‍යයනය කිරීම නිවැරැදි නිගමනයක් උදෙසා බෙහෙවින් ඉවහල් වන කාරණයකි. පතිරාජගේ වෘත්තාන්ත චිත්‍රපට සංඛ්‍යාව ගණනින් දහයකට නොවැඩිය. මෙයිනුදු තෝරාගත් චිත්‍රපට (අහස්ගව්ව, බඹරුඇවිත්, පාරදිගේ, සොල්දාදුඋන්නැහේ ) කිහිපයක් පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනයක් තුන්වන පරිච්ඡේදය යටතේ සාකච්ඡා කල අතර ඒ යටතේම ධර්මසේන පතිරාජගේ චිත්‍රපට පිළිබඳ ඔහුගේ පුද්ගලික මත විමසුම අධ්‍යයනයට ලක් කෙරිණි. නිබන්ධයේ හතරවන පරිච්ඡේදයෙන් ධර්මසේන පතිරාජගේ සිනමාව ඍජුවම දේශපාලන සිනමාවක් නියෝජනය කරයි යන උපකල්පනය තහවුරු කිරීම සඳහා පතිරාජගේ චිත්‍රපට බිහි වූ වකවානුවේ සමාජ ආර්ථික සහ දේශපාලනික හැසිරීම හා ඔහුගේ චිත්‍රපට අතරේ සබැඳියාව නිරීක්ෂණය කිරීමත් ධර්මසේන පතිරාජගේ සමකාලීන සිනමාකරුවන් කොතෙක් දුරට තම සිනමා නිර්මාණ තුළින් දේශපාලන සාධක ඉස්මතු කරන්නේද යන්නත් සාකච්ඡා කළේය. පස් වන පරිච්ඡේදය මගින් සමාලෝචනය හා නිගමනය එනම් 1970 දශකයෙන් පසු වෘත්තාන්ත සිනමාවට පිවිසි ධර්මසේන පතිරාජ, ලෙස්ටර් ජේම්ස් පීරිස් ගත් සිනමා මාවතට වෙනස් අයුරකින් ප්‍රවේශය ලැබීය. පතිරාජ තම සිනමා කාර්යයේදී තාත්වික භාවයත් යථාර්ථවාදයක් ගුරු කොට ගනිමින් ඊට දේශපාලනමය ආවේශයක් ලබා දීමට ප්‍රයත්න දැරීය. එනයින් පතිරාජ ඍජුව මෙන්ම වක්‍රව ද දේශපාලනික දෘෂ්ටියකින් තම සිනමා නිර්මාණ බිහි කරන දේශීය සිනමාවේ එකී ගති ලක්ෂණ සැලසුම් සහගත ලෙස විකාශනය කරනු ලබන සිනමා කරුවාය.

කෙසේ වතුදු මෙම පර්යේෂණ නිබන්ධය පරිපූර්ණ අධ්‍යයනයක් නොව පතිරාජගේ තෝරා ගත් චිත්‍රපට හතරක් ආශ්‍රයෙන් දේශපාලන සිනමාවක ගති ලක්ෂණ තහවුරු කර ගැනීමට ගත් උත්සාහයකි.